# අලෙවියට අත දෙන ආයතනයක් : ඌව ග්‍රාම පදනම

ප්‍රශ්නය: ඌව ග්‍රාම පදනම ආරම්භ කරන ලද්දේ මොන විදියේ පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා ද?

පිළිතුර: ඌව පළාතේ දුප්පත් ගොවි ජනතාවට ඔවුන්ගේ ආර්ථිකය ගොඩනඟා ගැනීමට අතදීම සඳහායි, අපි මෙම සංවිධානය 1984 අවුරුද්දේදී ආරම්භ කළේ.

ප්‍රශ්නය: එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ඔබ සංවිධානය අනුගමනය කලේ කුමන වැඩ පිළිවෙලක්ද?

පිළිතුර: ඌව ග්‍රාම පදනම විසින් ගම් මට්ටමේ සංවිධාන බිහි කිරීමට, පිහිටුවීමට ප්‍රයත්න දරන්නේ නැහැ. ප්‍රදේශයේ අවශ්‍යතාවයන්, ගැටළු, හඳුනාගත් ගොවීන් විසින් පිහිටුවා ගත් විවිධ සංවිධාන ගම් මට්ටමේ තිබෙනවා. එවැනි සංවිධාන, කණ්ඩායම්වල උනන්දුව මත ඉදිරිපත්වීම අනුව ඒවාට උපකාර කිරීමට පදනම හැකි සෑම අවස්ථාවකම ප්‍රයත්න දරනවා. ස්ථාපිත සංවිධාන / කණ්ඩායම් මාර්ගයෙන් ගමට පිවිසීම අපගේ සංවර්ධන උපක්‍රම වලින් එකක්.

ප්‍රශ්නය: දැනට පදනම මගින් ආධාර, නැතහොත් මඟ පෙන්වීම ලබන ග්‍රාමීය මට්ටමේ සංවිධාන / කණ්ඩායම් තිබෙන ගම් කිහිපයක් නම් කරන්න පුළුවන්ද?

පිළිතුර. පුළුවන්. කීනගම, කුඹල්වෙල, දෝව, දික් අරාව, මඩුවැල්පොත හා දියතලාව යන ප්‍රදේශවල අපේ ආධාර, මඟපෙන්වීම යටතේ ගම් මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ප්‍රශ්නය: කලින් සඳහන් කළ ගම්වල ක්‍රියාත්මක වන්නේ මොන විදියේ වැඩසටහන්ද ?

පිළිතුර: ඌව ග්‍රාම පදනම ගොවිතැන් කටයුතුවල යෙදී සිටින ගොවීන්ට ණය ලබාදීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරලා තියෙනවා. එම ණය මුදල දීම සඳහා ඇපයක් හෝ වෙනයම් ඇපකාරයෙකුගේ අවශ්‍යතාවයක් නැහැ. මෙහිදී අනුගමනය කරනු ලබන එකම කොන්දේසිය ණය මුදලක් ගැනීම සඳහා සාමාජිකයන් හයදෙනෙක් හෝ දහදෙනෙක් එකතු වී කණ්ඩායමක් පිහිටුවා ගැනීමයි,

ප්‍රශ්නය: මෙකී කුඩා කණ්ඩායමකට ණය මුදලක් නිකුත්කරනු ලබන්නේ කෙසේද?

පිළිතුර: එක් සාමාජිකයෙකුට උපරිම වශයෙන් රුපියල් 2000 ක ණය මුදලක් මාසයකට 2% පොළිය මත බැංකුව මගින් නිකුත් කරනවා. එක් පුද්ගලයෙකුගේ ඇපය වෙනුවෙන් කණ්ඩායමේ සියළුම සාමාජිකයින් ඇපවිය යුතුයි.

ප්‍රශ්නය: මෙම ණය මුදල් පදනමට අයත් මුදල් ද? එසේ නැති නම් පදනම විසින් බැංකුවෙන් ලබාදෙන මුදල්ද?

පිළිතුර: පදනම මුදල් ණයට ලබාදෙන්නේ නැහැ. මෙහිදී කරනු ලබන්නේ පදනමේ ඉල්ලීම මත බැංකුව විසින් ගොවීන්ට මුදල් නිකුත්කිරීම. පදනමේ නාමයෙන් මුදල් නිකුත්කිරීමට ඇපකරු වශයෙන් කටයුතු කරන්නේ බැංකුව පිළිගත් විදේශීය සංවිධානයක්.

ප්‍රශ්නය: ගොවීන්ට ලබාදුන් ණය මුදල් ආපසු අයකර ගැනීමේදී ගැටළු සහගත තත්ත්වයන් මතුවී ඇද්ද?

පිළිතුර: මෙතෙක් එවැනි ගැටළුවක් මතුවෙලා නැහැ. ගොවීන් තමන් ලබාගත් මුදල් ආපසු ගෙවීමට දක්වා තිබෙන උනන්දුව අනුව විශ්වාසනීයත්වය ආරක්ෂා වී තිබෙනවා.

ප්‍රශ්නය: ගොවීන් මෙම ණය මුදල් ප්‍රධාන වශයෙන් ආයෝජනය කරන්නේ කුමන කාර්යයන් සඳහාද?

පිළිතුර: ණය මුදල් ප්‍රධාන වශයෙන් ආයෝජනය කරන අංශ හතරක් දක්නට ලැබෙනවා. ඒවා නම් පොහොර, රසායනික ද්‍රව්‍ය, ගොවි උපකරණ හා බීජ වර්ග මිලදී ගැනීම සඳහා.

---

ඌව ග්‍රාම පදනමේ නියෝජ්‍ය සභාපති

**අයිවර් ඩී. ආබෲ මහතා**

සමග

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිළධාරීන් වන

**බංඩාර රත්නායක සහ එස්. එම්. කේ. බී. නන්දරත්න**

කළ සාකච්ඡාවක් ඇසුරිනි.

---

ප්‍රශ්නය: ගොවීන් විසින් නිපදවනු ලබන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ඌව ග්‍රාම පදනම විසින් කිසියම් පියවරක් ගෙන තිබෙනවාද?

පිළිතුර: ඔව්, බණ්ඩාරවෙල හා අවට ප්‍රදේශවල විශේෂයෙන් වගාකළ හැකි එළවළු වර්ග අතුරින් තක්කාලි, අර්තාපල්, බෝංචි, ගෝවා හා කැරට් ප්‍රධාන තැනක් ගන්නවා. මේවා අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ප්‍රධාන ගැටළුව තමයි, වෙළෙන්දන්ගේ ග්‍රහණයෙන් මිදී තම නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබාගැනීමට නොහැකි වීම.

මීට අමතරව අතරමැදි තැරැව්කාරයින්ගේ ග්‍රහණයට ගොවීන් නිතර හසුවෙනවා. පදනමේ ආර්ථික ශක්තිය අනුව ප්‍රදේශයේ සෑම ගොවියෙකුගේම නිෂ්පාදන මිලදී ගැනීමට පුළුවන්කමක් නැහැ. එයට බලපාන ප්‍රධාන හේතු දෙකක් තියෙනවා. එකක් ප්‍රමාණවත් අරමුදල් නැතිකම, අනෙක ප්‍රවාහන පහසුකම් නොමැතිකම.

කෙසේ වෙතත් පදනමේ ණය, ආධාර යටතේ එළවළු වගාකරන ගොවීන්ගේ නිෂ්පාදන හැකිතරම් මිළදී ගැනීමට අපි උත්සාහ කරනවා.

ප්‍රශ්නය: ගොවීන්ගේ මෙම නිෂ්පාදන මිලදී ගැනීමේදී ඔබ ආයතනය විසින් මිලගණන් නියම කරන්නේ කෙසේද?

පිළිතුර: එදිනෙද වෙළඳපොලේ පවතින මිල අපි මේ සඳහා පදනම් කරගන්නවා. නමුත් අපි ළඟ අතරමැදියන්, තැරැව්කාරයන් නැතිනිසා, ගොවීන්ට ඉහළ මිලක් ගෙවීමට අපට පුළුවන්වෙලා තිබෙනවා.

ප්‍රශ්නය: එළවළු වගාකරන කාලවලදී මාසයකට කොතරම් එළවළු ප්‍රමාණයක් ඌව ග්‍රාම පදනම විසින් මිලදී ගන්නවාද?

පිළිතුර: මාසයකට එළවළු ටොන් 15 ක් මිලදී ගන්නවා.

ප්‍රශ්නය: පදනම විසින් මිලදී ගනු ලබන එළවළු අලෙවි කරන්නේ කා හටද?

පිළිතුර: අපි මිලදී ගන්නා එළවළු කොළඹට ප්‍රවාහනය කරනවා. එහිදී ඒවා විදේශීය වෙළඳපොළටත්, දේශීය වෙළඳපොළටත් ඒ වගේම අතුරු නිෂ්පාදන සකස් කිරීම සඳහාත් (ජෑම්, චට්නි, සෝස්, සෑදීමට) අලෙවි කරනවා.

ප්‍රශ්නය: බණ්ඩාරවෙල සිට කොළඹට ප්‍රවාහනය කරන එළවළු මිලදී ගන්නා නියමිත ගැනුම්කාරයින් සිටිනවාද?

පිළිතුර: ඔව්, සනිහිල් සමාගම, ජනවසම, ගැලවීමේ හමුදව, නිස්කෝ තරුණ ව්‍යාපාරය, හේලීස් සමාගම, සිංගප්පූරු ගුවන් සේවය වැනි ආයතන එළවළු මිලදී ගන්නවා. මීට අමතරව පාරිභෝගිකයන්ගේ පහසුව තකා මිශ්‍ර එළවළු බෑග්වලට දමා සිල්ලරට අලෙවි කරනවා.

ප්‍රශ්නය: මිශ්‍ර එළවළු අලෙවිකරණය පිළිබඳව විස්තරයක් කරන්න පුළුවන්ද?

පිළිතුර: ගෘහණියන්ගේ පහසුව සඳහා අසුරණු ලබන එළවළු මාළු වර්ග දෙකක් තිබෙනවා. එක් බෑගයක එළවළු කිලෝ ග්‍රෑම් 3 ක් තිබෙන අතර මෙහි එළවළු ජාති 6 ක් අඩංගු වෙනවා. අනිත් බෑගයේ එළවළු කිලෝ ග්‍රෑම් 1 1/2 ක් තිබෙන අතර එළවළු ජාති 5 ක් අඩංගු වෙනවා.

ප්‍රශ්නය: කොළඹට ගෙනෙන මේ එළවළු බෑග් අලෙවි කරන්නේ කෙසේද?

පිළිතුර: කොළඹ, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව පිටුපස පිහිටි ඌව සේවාසැල මගින් අලෙවි කරමින් සිටියා. නමුත් දැනට මාස කීපයක සිට එය පවත්වාගෙන යෑමට පුද්ගලයෙක් නොමැතිකමින් වසාදමා තිබෙනවා. දැන් කරනු ලබන්නේ කොළඹින් එන ඇණවුම් බාරගෙන ඒ අනුව එළවළු බෑග් බාරදීමයි. සිකුරාදට අවශ්‍ය එළවළුවල ඇණවුම් බදාදටත්, සඳුදට අවශ්‍ය බඩුවල ඇණවුම් සිකුරාද ටත් අපි ලබාගන්නවා.

ප්‍රශ්නය: ඔබ සංවිධානය එළවළු වගාවට අදාලව ගොවීන්ට අවශ්‍ය ව්‍යාපෘති සේවාවක් ලබා දෙන්නේද?

පිළිතුර: එළවළු වගාවේදී බෙහෙවින් වැදගත් වෙන කෘමිනාශක සහ පොහොර භාවිතය පිළිබඳව, ගොවීන්ට අවබෝධයක් ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් හේලීස් සමාගමේ සහාය ඇතිව පවත්වාගෙන යනවා. මෙම පුහුණු පංති මාර්ගයෙන් කෘමිනාශක භාවිතා කිරීමේ ක්‍රම පිළිබඳවත් දැනුමක් ලබාදී, ගතයුතු ආරක්ෂක විධි ගැන ද කියා දෙනවා. ඊට අමතරව අරපිරිමැස්මෙන් යුතුව රසායනික යෙදවුම් භාවිතා කරන්නේ කෙසේද? වැඩි අස්වැන්නක් සඳහා පොහොර යෙදිය යුතු ආකාරය කුමක්ද? යනාදිය පිළිබඳවත් ගොවීන්ට කුසලතාව යක් ලබාදීමට ප්‍රයත්න දරා තිබෙනවා. එය ප්‍රයත්න වලින් සාර්ථක ප්‍රතිඵල නෙලාගැනීමට හැකිවූ බව ගොවියන් විසින්ම ප්‍රකාශ කර තිබෙනවා.

ප්‍රශ්නය: ඔබ පදනම මගින් දුන් ණය මුදල් සහ ව්‍යාප්ති සේවා ලබාගත් ගොවීන්, තමන්ගේ එළවළුවලට වැඩිමිළක් බලා පොරොත්තුවෙන්, වෙනත් පුද්ගලයන්හට ඒවා අලෙවි කොට තිබෙනවාද?

පිළිතුර: මෙතෙක් අප ලබා තිබෙන අත්දැකීම් අනුව ගොවීන් එසේ කිරීමට පෙළඹිලා නැහැ. ඊට තුඩුදුන් ප්‍රධාන හේතු තුනක් තිබෙනවා. එකක් අපි හොඳ මිලක් ගොවීන්හට ලබාදීමට නිතරම මහන්සි ගෙන තිබෙනවා. අනෙක වෙළඳ භාණ්ඩ මිලදී ගැනීමේදී නියම ලෙස බර කිරීමට පුරුදු වී සිටිනවා. අනිත් එක තමයි භාණ්ඩවලට එවේලේම මුදල්දීමට වැඩපිළිවෙලක් සකස් කොට තිබීම.

ප්‍රශ්නය: එළවළු වගාවේ යෙදී සිටින ගොවීන්ට අතදීමට අමතරව, පදනම විසින් කරන වෙනත් කටයුතු මොනවාද?

පිළිතුර: ආදයම් උත්පාදක ගෘහ කර්මාන්ත පවත්වාගෙන යෑමට අතදීමෙන් ප්‍රදේශයේ ගැමියන්ට කිසියම් අදායමක් උපදවා ගැනීමට අවස්ථාවක් සලසා දී තිබෙනවා.

ප්‍රශ්නය: මේ ගෘහ කර්මාන්ත මොන ආකාරයේ ඒවාද?

පිළිතුර: කිතුල්පැණි සෑදීම, තුනපහකුඩු සෑදීම, සබන් සෑදීම, හඳුන් කූරු සෑදීම සහ දර උඳුන් සෑදීම වැනි ඒවා.

ප්‍රශ්නය: ගෘහ කර්මාන්ත ලෙස නිපදවන මෙම භාණ්ඩවලට සමාන භාණ්ඩ, විවෘත වෙළඳපොළේ සෑහෙන පමණ තිබෙන නිසා අලෙවි කිරීමේදී දුෂ්කරතාවයන් පැන නගින්නේ නැද්ද?

පිළිතුර: තිබෙන එකම දුෂ්කරතාවය ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැතිකමයි.

ප්‍රශ්නය: ඒ සඳහා ඇති දුෂ්කරතා මොනවාද?

පිළිතුර: ප්‍රධාන දුෂ්කරතාවය ගෘහ කර්මාන්ත පවත්වාගෙන යෑම සඳහා අවශ්‍යතා ණය පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූලධනයක් පදනම සතු නොවීමයි. අනික් කරුණ මුළු නිෂ්පාදනයම මිලදී ගැනීමට තරම් ප්‍රමාණවත් මුදල් පදනම සතුව නොතිබීම.

ප්‍රශ්නය: ඒ කියන්නේ පදනමට මීට වඩා මූල්‍යමය ශක්තියක් තිබුණා නම් ගොවීන්ට වැඩි සේවයක් කරන්න පුළුවන් කියන එකද?

පිළිතුර: ඔව්. යම් හෙයකින් පදනමේ ආර්ථික ශක්තිය සතුටු දයක අධියරක පැවතියා නම් අදට වඩා ලොකු සේවයක් ඌව ප්‍රදේශයේ ගැමි ජනතාවට ඉටු කිරීමට පුළුවන් වෙනවා.

කොහොම වුණත් පදනම සතුව තිබෙන සම්පත් ප්‍රමාණය අනුව ඌව ප්‍රදේශයේ දුප්පත් ගොවි ජනතාවට කරන්නට පුළුවන් වුන සේවාව ගැන අපිට අවංකවම සතුටු වෙන් පුළුවන්.